
1

## 1.3 විශේෂාංග රූප සටහන්
## මාසික විදේශීය ජංගම ගිණුමේ සංඛ්‍යාන දත්ත

මාසික විදේශීය ජංගම ගිණුමේ සංඛ්‍යාන දත්ත




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

2024 වසරේ දී මාස දෙකක හැර බොහෝ මාසවල දී ජංගම ගිණුමේ ශේෂය ධන අගයක පැවතීම හේතුවෙන් ජංගම ගිණුමේ වාර්ෂික අතිරික්තයක් වාර්තා විය. සංචාරකයන්ට වීසා පහසුකම් ලබා දීම ආශ්‍රිතව මතු වූ බාධා හේතුවෙන් සංචාරක ව්‍යාපාරයට බලපෑම් එල්ල වීම සහ සංචාරකයන් සාමාන්‍යයෙන් අඩුවෙන් පැමිණෙන කාල වකවානුවක් වීම නිසා 2024 වසරේ සැප්තැම්බර් මාසයේ දී සේවා ගිණුමේ අතිරික්තය අසාමාන්‍ය ලෙස අඩු විය. 2024 වසරේ දෙසැම්බර් මාසයේ දී, ප්‍රාථමික ආදායම් ගිණුමේ පොලී ගෙවීම් ලෙස සහ සේවා ගිණුමේ රජයේ වියදම් ලෙස සැලකිය යුතු ගෙවීම් සිදු වූ අතර, ඒ දෙක ම ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ප්‍රතිව්‍යුහගත කිරීමට අදාළ විය. 2025 වසරේ මුල් මාස දෙක තුළ දී ද ජංගම ගිණුමේ අතිරික්තයක් වාර්තා වූ අතර, සංචාරක ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල ශක්තිමත් වර්ධනය මේ සඳහා හේතු විය.